# ශ්‍රී ලංකාවේ ලෝක උරුම ආශ්‍රිතව ගොඩනැගී ඇති රැකියා අවස්ථා මගින් ලංකාවේ ආර්ථික වර්ධනයට සහ සමාජ සුබසාධනයට දක්වන දායකත්වය කෙසේද?

කොඩිතුවක්කු කේ.එච්.ඒ.ඩී.ඒ.පී.[1]

අතීත මානවයාගේ පතැවැත්ම සහ ක්‍රියාකාරකම් පිළිබඳව මූලික වාර්තාවක් සැපයෙන් පුරාවිද්‍යාත්මක සාධකය උරුම ලෙස නම් වේ. සැබැවින්ම රටකට පුරාවස්තු (උරුම) යනු සම්පත් ආකරයකි. ශ්‍රී ලංකාව වනාහි වසර දහස් ගණනක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් පවතින රටක් සහ පුරාණ ඉතිහාසගත හා සංස්කෘතික උරුමයන් ගෙන් පිරී ඇති දූපතකි. මෙම උරුමයන්ගෙන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික, ආගමික, සමාජයීය, ආර්ථික, සහ දේශපාලනික ලක්ෂණයන් විදහා දක්වන නිසාවෙන්ද, අනෙකුත් රටවලට නොමැති සංස්කෘතික, සමාජයීය, ආගමික අංගයන් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන නිසාද, ලොව වටා සංචාරකයින්ගේ විශාල ආකර්ෂණයක් ගොඩනැගී තිබීම සුවිශේෂී වේ. ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්කර ඇති ලෝක උරුමයන් වන මහනුවර නගරය, සීගිරිය පෞරාණික පුරවරය, අනුරාධපුරය සහ පොලොන්නරුව පූජනීය පුරවරය, ගාලු කොටුව සහ ඒ ආශ්‍රිත ප්‍රදේශය, සිංහරාජ රක්ෂිත වනාන්තරය, රංගිරි දඹුලු විහාරය සහ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර ප්‍රදේශය යනාදිය ආශ්‍රිතව සංචාරක ආකර්ෂණය ඉතාමත් ඉහළ අගයක් ගනී. මේ නිසාවෙන් මෙම ලෝක උරුමයන් කේන්ද්‍ර කොටගෙන විශාල සංචාරක ව්‍යාපාර පද්ධතියක් සහ ආර්ථික පද්ධතියක් ගොඩ නැගී ඇති අතර සුළු පරිමාණ ව්‍යාපාරිකයින් ගේ සිට මහා පරිමාණ ව්‍යාපාර දක්වා ව්‍යාපාර ජාලයක් ගොඩනැගී ඇත. මේ හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දක්වන මෙහෙය අති විශාලය. මෙම ව්‍යාපාරික ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දක්වන දායකත්වය කෙසේද? යන්න සහ මේ හරහා සමාජයේ ඇතිවන සුභසාධනය කෙසේද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස සඳහන් කළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචාරක කේන්ද්‍රස්ථාන ලෙස ප්‍රධාන වශයෙන් ලෝක උරුමයන් පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස යොදා ගනිමින් ශ්‍රී ලංකා සංචාරක කටයුතු අමාත්‍යංශය, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා ආදි ද්විතීක මූලාශ්‍ර මගින් ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීම සිදු කරන ලදි. කෙසේ වෙතත් සංචාරක ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ බරපැන විශාල වශයෙන් වශයෙන් උසුලන ක්ෂේත්‍රයකි. කුඩා පරිමානයේ විසිතුරු භාණ්ඩ අලෙවි කරන පුද්ගලයා ද, මහා පරිමාන හෝටල් හිමියා ද ගත් විට ඔවුන්ගේ ආර්ථිකය සංවර්ධනය වන්නේ මෙම රැකියාව හේතුවෙනි. සංචාරකයින් නොමැතිනම් සංචාරක ස්ථාන නොමැති නම් ඔවුන්ට රැකියාව අහිමි වී යයි. එම නිසා මෙම සංචාරක කේන්ද්‍රස්ථාන ආශ්‍රිතව ගොඩනැගී ඇති රැකියා හරහා ආර්ථිකයට මෙන්ම සමාජ සුබසාධනයට ද දක්වන දායකත්වය අති විශාල බව ගම්‍යමාන කිරීම මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය ලෙස හඳුන්වා දිය හැකිය. මන්දයත් මේ නිසාවෙන් විශාල පවුල් සංඛ්‍යාවකගේ දරිද්‍රතාව, විරැකියාව ආදී වූ ආර්ථික ගැටලු මෙන්ම මිනිසාගේ ආර්ථික තත්වය යහපත් නම් හොරකම, පවුල් ආරවුල්, වංචා, දූෂණ, මංකොල්ලකෑම් ආදී සමාජ අකටයුතුකම්ද අවම වන නිසාවෙනි.

**මුඛ්‍ය පද :** ලෝක උරුම, සංචාරක ව්‍යාපාරය, ආර්ථික සංවර්ධනය , විරැකියාව , දරිද්‍රතාවය

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රජරට විශ්ව විශ්වවිද්‍යාලය.